**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 23 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අයවිය යුතු රු.387,030 ක් වූ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.1,797,721 ක හිඟ පොළ බදු කුලී ආදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු ආදායම් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.154,257 ක් හා මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ රු.300,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.1,050,297 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර තිබුණු පොදු තැන්පත් රු.458,411ක් පොදු තැන්පත් ගිණුම බැරකර සමුච්චිත අරමුදල් ගිණුම හර කිරීම හේතුවෙන් රු.458,411 බැගින් සමුච්චිත අරමුදල් ගිණුම අඩුවෙන්ද , තැන්පත් ගිණුම පොදු වැඩියෙන්ද දැක්වේ. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට විෂය භාර නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත. |

**(ආ)** **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.77,115,390 ක ඉඩම් හා ගොඩනැගිලි ශේෂය සත්‍යාපනය සඳහා ඔප්පු, පිඹුරුපත් හා පැවරුම් නියෝග විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉඩම් පවරාගෙන මැනුම් කටයුතු සිදු කිරීමට ප්‍රාදේශිය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. |

## 1.4 <u>අනුකූල නොවීම</u>

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | නුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) <u>1987 අංක 1 5 දරන ප්‍රාදේශීය සභා පනත</u> | | | |
| 126(vii) ඊ වගන්තිය හා 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් නිවේදනයේ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය | රිදීමාලියද්ද මංසන්ධියේ ස්ථාන 24 ක තිබුණු දැන්වීම් පුවරු සඳහා අයවිය යුතු රු.101,200 ක ගාස්තුව අයකර ගෙන නොතිබුණි. | අයවිය යුතු ගාස්තු අයකරගත යුතුවේ. | අයවිය යුතු ගාස්තු ගෙවන ලෙසට අදාල ආයතන වෙත ලිපි යවා ඇත. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ රු.127,049 ක පොදු තැන්පතු 12 ක් නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලසි අනුව අදල කටයුතු කළ යුතුවේ. | මෙම අඩුපාඩුව නිවැරදි කිරිමට විෂය නිලධාරින් දැනුවත් කර ඇත. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,966,982 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,822,307 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,498,500 | 2,498,500 | 716,035 | 1,782,465 | 495,000 | 495,000 | 579,249 | - |
| (ii) | කුලී | 5,884,000 | 5,884,000 | 6,850,802 | - | 6,816,211 | 6,816,211 | 5,410,263 | 1,405,948 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 812,100 | 812,100 | 616,000 | 196,100 | 762,100 | 762,100 | 621,250 | 140,850 |
| (iv) | වෙනත් ආදායම් | 1,817,000 | 1,817,000 | 2,678,717 | - | 1,502,000 | 1,502,000 | 2,470,052 | - |
| | එකතුව | 11,011,600 | 11,011,600 | 10,861,554 | 1,978,565 | 9,575,311 | 9,575,311 | 9,080,814 | 1,546,798 |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි,ප්‍රාග්ධන ආධාර රු.5,011,526 ක්, කඩ කුලී රු.157,799 ක්,මුද්දර ගාස්තු රු.2,799,154 ක් සහ උසාවි දඩ රු.909,027 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ ආදායම් අය කර ගැනීමට අදාල නිලධාරීන් දැනුවත්කර ඇත. |

### 2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.909,027 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.3,186,184 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | උපලේඛන සකස් කර පළාත පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 15 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 15 ක් දැනටමත් වැළඳගෙන ඇති බව හා අනෙකුත් කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට උපදෙස් ලබාදී ඇත. |

**(ආ) ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා පිළියෙල කිරිමට විෂය නිලධාරින් දැනුවත් කර ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ “තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදි ක්‍රියාත්මක කරන සංවර්ධන යෝජනා සඳහා මෙම දර්ශක ඉවහල් කරගනිමින් කටයුතු කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 07 කට අදාලව පුරප්පාඩු 07 ක් පැවතුනි. | අත්‍යාවශ්‍යා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල මිළගණන් කැඳවීමකින් තොරව අවස්ථා 05 කදී රු.166,880 ක ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි. | ද්‍රව්‍ය හා සැපයුම් ලබා ගැනීමේදී මිලගණන් කැඳවිය යුතුවේ. | මෙම ගැටළුව ඉදිරියේදි ඇති නොවීමට වග බලාගන්නා ලෙසට විෂය නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ආ) | වසර 05 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණයහිමි රු.1,386,237 ක්,කර්මාන්ත ණයහිමි රු.11,936,857 ක් සහ කඩ කාමර ණයහිමි රු.2,353,791 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනිමට අදාල විෂය නිලධාරින් දැනුවත් කර ඇත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | කමිටු රැස්වීම් පැවැත්විම පළාත් පාලන ආයතන ඒකාබද්ධ කර පවත්වා ඇති බව හා නිලධාරින් සම්බන්ධ කරගැනීමේ අපහසුතාවය නිසා පළාත් පාලන ආයතන මට්ටමින් විගණන කමිටු රැස්වීම් පැවැත්වීම අපහසුය. |